ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2013 ඔක්තෝබර් 21 සඳුදා
05 වෙළුම - 51 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 52/ News/ 2013

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



## දරුවන්ට අත්වැලක් වූ ළමා නගරයේ හෝටල් පාසල

# නාසරෙත් – නුවරඑළිය

ඡායාරූපය: හිල්මා අලහකෝන්

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# දයාන්විතව අපිත් ගුරු දිනය සමරමු.

## ආදරණීය දුවේ පුතේ...

අප ජීවත් වන සමාජයේ සුවහසක් වෘත්තීන් අතරින් ඉතා උසස් හා අභිමානවත් ලෙස සලකනු ලබන්නේ ගුරු වෘත්තියයි. එලෙසම ශුද්ධවූ කතෝලික සභාවේ ඉගැන්වීම් අනුව මෙම වෘත්තිය රැකියාවක් හැටියට ගණන් ගැනෙන්නෙ නැහැ. කතෝලිකයින් වශයෙන් ආදර දුවේ පුතේ, අපි විශ්වාස කරන්නේ ගුරු වෘත්තිය නැතිනම් සේවාව දෙවියන් වහන්සේ විසින් දෙනු ලබන කැඳවීමක් හැටියටමයි. මේ උතුම් කැඳවීම් ජීවිතය පිළිබඳව නිරන්තරයෙන්ම කතෝලික සභාවේ ගුරුවරුන්හට මතක් කිරීමක්ද කරනු ලබනවා. දැන් දෙවියන් වහන්සේ විසින් දෙනු ලබන කැඳවීමක් පිළිබඳව කථා කිරිමේදී ඒ ලබන කැඳවීමට පිළිතුරු ලබා දීමටද කතෝලිකයා හට ණය යුක්තියක් තිබෙනවා. ඒ අනුව ගුරු සේවාවේ කැඳවීමට පිළිතුරු දීමේදී ඒ පිළිබඳව විශ්වාසයෙන් සෑම ගුරුවරයෙක්ම වගකිව යුතු වන්නේද දෙවියන් වහන්සේටයි. ඒ අනුව කතෝලික ගුරුවරයා තම කැඳවීම දෙවියන් වහන්සේගෙන්ම ලබන අතර එය ඉටු කිරීම පිළිබඳව පිළිතුරු දිය යුත්තේද දෙවියන් වහන්සේටයි.

ආදර දුවේ පුතේ, ගුරුවරයාට පැවරෙන කාර්යය ක්‍රිස්තුන් වහන්සේ විසින්ම පවරා ඇති බව ශු. ලූක් තුමාගේ සුවිශේෂ යේ ලූක් 18/16-17 වගන්ති වලින්ම අවබෝධ වෙනවා. ''ළදරුවන් මා වෙත එන්නට ඉඩ හරින්න. ඔවුන් නොවළක්වන්න. මන්ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙබඳුවන්ගේය'' යනුවෙන් පවසා වදාරමින්, දරුවන්ගේ ජීවිත යහමං ගැන්වීම තුළින් වඩා හොඳ යහපත් සාමකාමී, නැණවත් සමාජයක් බිහිකිරිමේ කාර්යයක් අපට පවරා තිබෙනවා. දැන් බලන්න අපි ජීවත් වන සමාජය තුළ එම උතුම් කාර්යය ඉටු කරන්නේ කවුද කියලා. ක්‍රිස්තුන් වහන්සේ විසින් පැවරූ එම කාර්යය අද මූලිකවම ඉටු කරනු ලබන්නේ ගුරුවරයා විසින්මයි.

ආදර දුවේ පුතේ, ඔබට උගන්වන, ඔබව යහමං ගන්වන ගුරුවරුන් පිළිබඳවත්, කතෝලික අධ්‍යාපනය පිළිබඳවත් ඔබේ දැක්ම කොහොමද කියලා දැන් ඔබ ගැඹුරින් හිතන්නට ඕනා. අපේ කතෝලික අධ්‍යාපනය හා එහි පසුබිම සම්පූර්ණයෙන්ම ගොඩ නැගී ඇත්තේ ඉහත සඳහන් කළ කෝන මානයන් ඔස්සෙයි. මනස පමණක් දියුණු කර බුද්ධිමතුන් බිහිකරන අධ්‍යාපනයකට වඩා මිනිස් ජීවිතයේ සෑම අංශයක්ම දියුණු කර මිනිසා පරිපූර්ණත්වයට පත්කරන අධ්‍යාපනයක් කතෝලික අධ්‍යාපන සම්ප්‍රදාය විසින් දැන් සියවස් ගණනාවක සිට ගොඩ නගා තිබෙනවා. ඒ සම්ප්‍රදාය යහපත් මිනිසුන් බිහිකර යහපත් ලොවක් ගොඩ නගා තිබෙන බව අපේ විශ්වාසයයි. ඒ වගේම කතෝලික ගුරුවරයා විසින් එදා මෙදා තුර බිහිකරන ලද යහපත් පුද්ගල චර්යයා පැවැත්ම ඇත්තෙන්ම ලොවක් ගොඩ නගා තිබෙනවා. විශේෂයෙන්ම කතෝලික ගුරුවරයාට බියක් නොමැතිව දෙවියන් වහන්සේ ඉදිරියෙහි තමන් ගොඩ නැගූ යහපත් මිනිසුන් සංඛ්‍යාව පිළිබඳව ගණන් දිය හැකි ශක්තියක් රැඳී පවතිනවා.

ආදර දුවේ පුතේ, ගුරුවරයාගේ කාර්යය භාරයේ ඇති විශේෂත්වය පිළිබඳව අවබෝධ කරගැනීමට අපට ශු. පාවුළුතුමා ඉතාමත්ම අභියෝගාත්මක ඉගැන්වීමක් ගෙන හැර දක්වා තිබෙනවා. එතුමා දේව වාක්‍ය දේශනා කිරීම පිළිබඳව පවසන්නේ දේව වාක්‍යය දෙපැත්ත කැපෙන කඩුවක් බවයි. එය අසනු ලබන්නාට මෙන්ම ප්‍රකාශ කරන්නාටද විශාල අභියෝගයක් බව ශු. පාවුළු තුමා පවසනවා. මේ අභියෝගය ගුරු සේවාව හා සම්බන්ධ කරන විට අදහස් වන්නේ ගුරුවරයා විසින් ශිෂ්‍යයාට උගන්වන දෙය ක්ෂණිකවම ගුරුවරයාටද අභියෝග කරන බවයි. ගුරුවරයා ශිෂ්‍යයාට පරමාදර්ශී පුද්ගලයකු වන අතර ඔහු හෝ ඇය තුළ ඇති පරමාදර්ශී, ගුණගරුක, යහපත් ආකල්ප ශිෂ්‍යයන් විසින්ද උකහා ගනු ලබනවා.

ආදර දුවේ පුතේ, කතෝලික ඉගැන්වීම අනුව යමින් අපි අධ්‍යාපනය නිර්වචනයකට ලක් කළ හොත් අධ්‍යාපනය සමඟ ආධ්‍යාත්මයක් ගොඩ නොනැගෙන තැන එලදායි අධ්‍යාපනයක් ගොඩ නොනැංවෙන බවද වටහා ගත යුතුයි. ධර්මයට අනුකූලව අධ්‍යාත්මයක් ගොඩ නගා ගැනීමට ඉවහල් වන පරිසරයක්ද පාසල තුළ තිබිය යුතුයි. ගුරුවරයා තුළින් විහිදෙන අධ්‍යාත්මික සුවඳ දරුවන් නිරන්තරයෙන්ම ප්‍රගුණ කර ගන්නා හෙයින් ගුරුවරයා පිරිපුන් ආධ්‍යාත්මයකින් හෙබි පුද්ගලයකු වීම අත්‍යවශ්‍යයි. කතෝලික ගුරු දිනය පැවැත්වීමෙන් හා එය සංකේතවත් කිරීමෙන් කතෝලික සභාව අපේක්ෂා කරන්නේද අධ්‍යාපනය සමඟ ආධ්‍යාත්මයක් ගොඩ නැගීමට කතෝලික ගුරුවරයාට ඇති අභියෝගය වෙතට ඔවුන් අවදි කර ලන්නටයි.

ඉතින් , ආදර දුවේ පුතේ, ක්‍රිස්තුන් වහන්සේ අපගේ අග්‍ර ගුරුවරයා වන අතරම ඒ අනුව යමින් සේවාව පුද කරන අපගේ ගුරුවර ගුරුවරියන් ගැන වඩාත් දයාන්විතව කල්පනා කරමින් ඒ අවැසි ගරුත්වය පුදමින්, ආදරය දෙවා ලමින් ජීවත් වන්නටත් හොඳ ගුරුවරයාගේ ජීවිත ආදර්ශය අනුගමනය කරන්නටත් ශක්තියක් ඇති කර ගනිමින් මේ ගුරු දිනය තුළ ඔබට ඔබේ ගුරුවරුන් හා සමඟ එකට ඒකාත්මික වන්නට ආරාධනාවක්ද කරනවා. ඉතිං අපිත් දයාන්විතව ගුරු දිනය සමරන්නට පෙළ ගැසෙමු.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක
**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**



## ත්‍රිත්ව ඒක දෙවියන් වහන්සේ

❖ ප්‍රඃ කුරුසියේ ලකුණ ඇඳීමෙන් ඔබ ශුද්ධවූ ත්‍රිත්වය විශ්වාස කරන බව පෙන්වන්නේ කෙසේ ද?

උඃ එය අවසානයේ දී තුන් දෙනා වහන්සේලා නම් කිරිමෙන් ය.

❖ ප්‍රඃ දෙවියන් වහන්සේට පටන් ගැන්මක් හෝ අන්තිමයක් හෝ තිබේ ද?

උඃ දෙවියන් වහන්සේට පටන් ගැන්මක් හෝ අන්තිමයක් හෝ නැත. උන්වහන්සේ අනාදි හා අනන්ත වන සේක.

❖ ප්‍රඃ දෙවියන් වහන්සේ වැඩ සිටින්නේ කොහේද?

උඃ උන්වහන්සේ ස්වර්ග රාජ්‍යයෙහි ද මේ ලෝකයෙහි ද, සැම තැනමද වැඩ සිටින සේක.

❖ ප්‍රඃ දෙවියන් වහන්සේ අප දකින සේක් ද?

උඃ උන්වහන්සේ අප දකිමින් ආදරවත් පියකු මෙන් අප ආරක්ෂා කරන සේක

❖ ප්‍රඃ දෙවියන් වහන්සේ සියල්ල දන්නා සේක් ද?

උඃ උන්වහන්සේ සියල්ල දන්නා සේක, අපගේ ඉතා රහස් කල්පනා වචන සහ ක්‍රියා පවා දන්නා සේක.

❖ ප්‍රඃ දෙවියන් වහන්සේට හැම දේම කළ හැකි ද?

උඃ උන්වහන්සේට හැම දේම කළ හැකි ය.

❖ ප්‍රඃ දෙවියන් වහන්සේ යහපත් ද?

උඃ උන්වහන්සේ අප්‍රමාණ ලෙස යහපත්ය, අපේ යාච්ඤා වලට ඇහුම්කන් දී යහපත් දේ අපට දෙන සේක.

❖ ප්‍රඃ දෙවියන් වහන්සේ ශුද්ධ ද?

උඃ උන්වහන්සේ සුපරිශුද්ධ ය. උන්වහන්සේගේ දරුවන් එසේම ශුද්ධවසිටිනු දැකීමට කැමති වනසේක.

❖ ප්‍රඃ දෙවියන් වහන්සේ සාධාරණ ද?

උඃ උන්වහන්සේ සාධාරණය එක එක මනුෂ්‍යයාගේ ක්‍රියා අනුව විපාක දෙන සේක.

❖ ප්‍රඃ දෙවියන් වහන්සේ දයාවත් ද?

උඃ උන්වහන්සේ ඉතා දයාවත්ය. අපේ පාප වලට පසුතැවිලි වනවිට අපට සමාව දෙන සේක.

❖ ප්‍රඃ ශුද්ධවූ ත්‍රිත්වයට ප්‍රශංසා කිරීමට කියන කුඩා යාච්ඤාව කුමක් ද?

උඃ ශුඬවූ ත්‍රිත්වයට ප්‍රශංසා කිරිමට කියන කුඩා යාච්ඤාව ත්‍රිත්ව ස්තෝත්‍රයයි.

එය මෙසේය :- “පියාණන්, පුත්‍රයාණන් හා ශුද්ධාත්මයාණන් වන ත්‍රිත්ව ඒක දේවෝත්තමයාණන්ට ස්තෝත්‍ර වේවා. ආදියෙහි වූවාක් මෙන් දැනුත් නිතිපතාත් අනන්ත කාලයක්ම වේවා - ආමෙන්.”

## භාවනා කරමු

ආදර දුවේ පුතේ, ඉදිරි ලිපි තුළින් භාවනා කරන විවිධ ක්‍රම කිහිපයක් ඉගෙන ගනිමු. භාවනාව තුළින් ගැඹුරු දේව සබඳතාවයකට යොමු වීම සඳහා සිහිතබා ගත යුතු කරුණු කිහිපයක් ඇත.

1. භාවනා කිරිමට පෙර ශු. ලියවිලි පාඨයක් කියවා ඔබගේ ඇතුලාන්ත ජිවිතය පවිත්‍ර කර ගත යුතුය.

2. භාවනා කිරිමට නිහඬ නිශ්චල පරිසරයක් තෝරා ගත යුතුය.

3. භාවනා කිරීම සඳහා ශරීරය කෙළින් තබාගෙන පහසු ඉරියව්වකින් බිම වාඩි විය යුතුය.

4. සැම විටම අතීත හා අනාගත සිතිවිලිවලින් මිදි මෙම මොහොත කෙරෙහි අවධානය යොමු කරමින් සිත වර්තමානයේ රඳවා ගත යුතුය.

5. භාවනාවේ අවසාන අවස්ථාවට පැමිණෙන විට සිතිවිලි හෝ වචන හෝ සිතින් මවා ගත් රූප කෙරෙහි කිසිදු අවධානයක් නොදි ගැඹුරු නිහඬ, නිශ්චලතාවක් හා ඇතුලාන්ත සාමය අත්දැකිය යුතුයි.

6. භාවනාව අවසානයේදී පුංචි ඇගයිමක් කරන්න.

පුංචි ඇගයිමක් කරන අයුරු.

- භාවනාව කරන්න පුළුවන්ද?
- සිත එකලස් කර ගන්න පුළුවන් වුනාද ?
- පුද්ගලයන් සිතින් මවා ගන්න විට ඔබ තුළ ඇතිවු හැඟීම් මොනවාද ?
- හුස්ම සමග ඇතුලාන්ත නිහඬතාවයකට යන්න පුළුවන් වුනාද?
- ඇතුලාන්ත නිශ්චල බව හා සාමය අත්දැක්කාද?
- භාවනාව අවසානයේ සිත සැහැල්ලු වුනාද?

7. විවිධ භාවනා ක්‍රම ඉගනෙ ගත් පසු ඔබට පහසු එක් ක්‍රමයක් පුරුදු කරගෙන දිනපතා පුංචි භාවනාවක් කර පසුව ඇගයීමක් කරන්න.

8. භාවනාව තුළින් ජීවිතය වෙනස් කර ගෙන යහපත් පුද්ගලයකු වන්න.

ගරු ශිරෝමා ප්‍රනාන්දු පැවිදි සොයුරිය

# සෙබස්තියානු පාගමන සහ "පියවර" සිතුවම් දැක්ම





කීර්තිමත් ඉතිහාසයක් සනිටුහන් කරන මොරටු පුරවරයේ අභිමානය රැඳවූ සාන්ත සෙබස්තියන් විද්‍යාලීය පා ගමන වත්මන් අදියුරු ගරු බොනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමාගේ මූලිකත්වයෙන්, උප අදියුරු ගරු රෝහිත රුද්‍රිගු පියතුමන් ඇතුළු පියවරුන් සහ පැවිදි සොහොයුරියන්, ගුරුභවතුන්, සිසු දරුවන්, දෙමාපියන් සමග ආදිශිෂ්‍ය සැමගේ එකමුතුව තුළ 2013-10-26 දින පිය ඔසවයි. ඊට සමගාමීව ''පියවර'' නමින් සිතුවම් දැක්මක් විදුහල් භූමියේදී එදින පවත්වන අතර මෙහිදි ට්‍රිනාල් කවිෂ්ක කරුණාරත්න හා විසුලිමිණ සමාංග සුබසිංහ යන සිසුන්ගේ චිත්‍ර මෙහිදි ඉදිරිපත් කෙරේ. දුලාරි වික්‍රමසේකර ගුරුමෑණියන් මොවුන්ගේ කලා කෞෂල්‍ය ඔප් නැංවීමට මහගු දයකත්වයක් ලබාදෙන බව මෙහිදි සිහිපත් කරන අතර, ඔබ සැමට එය නැරඹීමට පැමිණෙන මෙන් මෙයින් ආරාධනා කරමු.

## ඔබේ සමිතිය ගැන අපිට ලියා එවන්න.




ඔබ පාසලේ, දහම් පාසලේ ඇති ළමා සමිති සමාගම් පිළිබඳව තොරතුරු පළ කිරීම සඳහා එම සමිතියේ තොරතුරු, නිලධාරි මඬුල්ලේ නම් ගම් ද ඇතුළත් කොට සමූහ සේයාරුවක් සමගින් විස්තර අප වෙත එවන්න.

"අපේ සමිතිය", ළමා ප්‍රදීපය,
අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

## ළමා ලේඛිකාව AAT පදනම් විභාගයෙන් උසස් ප්‍රතිඵල ලබයි



ළමා ප්‍රදීපයට ලියන නැග එන කතෝලික ළමා ලේඛිකාවක් වන ගම්පහ සිරිකුරුස විදුහලේ 12 වානිජ අංශයෙන් ඉගෙනුම ලබන අජන්දනා නිම්නාදි රුද්‍රිගෝ ශිෂ්‍යාව මෙවර AAT පදනම් විභාගයෙන් ව්‍යාපාර සන්නිවේදනය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය යන විෂයන් වලට ඉහළ සාමාර්ථ ලබා දස්කම් දක්වා ඇත. ඇය රන්පොකුණගම කන්‍යමරිය රාජේශ්වරියගේ දහම් පාසලේ ආදි ශිෂ්‍යාවක් ද වේ.

## කළුතර සිරිකුරුස විදුහලේ ශිෂ්‍ය නායක සංගමයෙන් ළමා නාට්‍යයක්



කළුතර සිරිකුරුස විදුහලේ අධ්‍යක්ෂ ආචාර්ය ගරු කැමිලස් ප්‍රනාන්දු පියතුමාගේ මඟපෙන්වීම මත, ශිෂ්‍ය නායක සංගමය විසින් සංවිධානය කරන ලද නාට්‍යවේදී නාලක ස්වර්ණතිලක මහතා විසින් අධ්‍යක්ෂණය කරන ලද, ''තටු සලන්න ඉඩ හරින්න'' ළමා නාට්‍යයේ මංගල දර්ශණය පසුගියදා විදුහල් ශ්‍රවණාගාරයේදී රඟ දක්වන ලදි. එදින මහජන දර්ශණයේ ප්‍රධාන ආරාධිතයා ලෙස කතෝලික පෞද්ගලික පාසල් සාමාන්‍යාධිකාරි ගරු රංජිත් මදුරාවල පියතුමන් සහභාගි විය. ලංකාවේ පාසලක ශිෂ්‍ය නායක සංගමයක් මගින් පාසල් දහයක සිසු සිසුවියන් සම්බන්ධකරගනිමින් නිපදවන ලද ප්‍රථම නාට්‍යය මෙය වීමද විශේෂත්වයකි.

**ඕ. ඇන්සලම් ප්‍රනාන්දු**

## අසීමිත දෙවිඳු ආදරය

දෙව්පියාණන් මැවූ මැවිල්ලේ
සොබාලංකාරය කියා පාන
නොයෙක් පැහැයෙන් යුත් විවිධාකාර වූ මල්
මිහිරි නාදෙන් ගී ගයන්නා වූ විහඟුන්
ගල් පර අතරින් ගලා යන්නා වූ ගංගාවන්
මේ අසිරිමත් සැමගෙන් දකිමි දෙවිඳුනී
ඔබේ ආදරේ
පූජාසනය මත අප වෙනුවෙන් පඬුරක් වී
ඔබේ ශ්‍රී ශරීරයෙන් හා ශ්‍රී රුධිරයෙන්
අප දිවි පෝෂණය කරන්නා වූ
ජීවමාන ජේසු සමිඳුනි
මා ඔබෙන් ලබන වරප්‍රසාද තුළ
මම අත්දකිමි නිරතුරු
ඔබේ අසීමිත වූ ආදරේ

**රුවනි ජීවන්තිකා විලේගොඩ**
13 ශ්‍රේණිය
ජේසු බිළිඳුන්ගේ කන්‍යාරාමය - රත්නපුර



## සැනසීම ඔබයි සමිඳුනි

ජීවන ගමනේ එක් නවාතැන් පළකදී
මුණ ගැසුණු ඔබ මට කඳුළු අතරින්
සිනාසෙන්නට සේම සත්‍ය දකින්නට,
මං පෙත් විවර කළේ ඔබගේ
අසීමිත වූ දයා කරුණාවයි.
දහස් වාරයක් මා නෙත් සොයන්නේ
ඔබගේම රුවයි
දහසක් දුක් කම්කටොළුවලට සතුට,
සැනසීම ද ඔබයි සමිඳුනි
ඔබේ අසීමිත දයා කරුණාවෙන්
මා නැහැව්ව මැනව දෙව් සමිඳුනි

**සිකිලා ජයාංගනී ජයකොඩි**
13 ශ්‍රේණිය
දංකොටුව බාලිකා මහ විදුහල




## පුංචි සුවාමි



ඔබේ හදවත දෙවිඳුන් තුළ
හරිම බැතිබරය
ඔබේ ඔවදන් පුංචි අපට
හරිම පිවිතුරුය

**රසිඳු උදාන් මාලිත**
6 ශ්‍රේණිය
සදාසරණ මාතා දහම් පාසල
රබේපිටිය - (කන්ජුක්කුලිය මීසම)



## යහපත් දරුවෝ

යහගුණ පිරි වචන කියන
කීකරු ලෙස ජීවත් වන
සුවඳැති පොඩි ළමයි වෙන්න
යහපත් දරුවෝ වෙමු අද සිට
මිණි කැට ලෙස දිළිසෙන
තව වැඩිවෙයි ඔප දැමූ විට
පුංචි අපිත් ඒ වාගේ
දිළිසෙමු පොඩි මිණි වාගේ

**රෝෂන් ලලන්ත**
04 ශ්‍රේණිය
සා. අන්තෝනි දහම් පාසල - අලගොල්ලෑව

## අද දරුවන්

ගතට, සිතට සුව යැයි සිතන මතට, වහලෙක්ව
දුරකථනයට , රූපවාහිනියට
විශ්ව ගම්මානය යැයි සිතන පරිඝනකයකට සිතුවිලි සිර කරනා
කෙටි පණිවුඩ වලට
අවයව සිර කරනා විලාසිතා වලට වැඩිවශයෙන් නැඹුරු වී ඇත
අද දරුවන්, ආදර සමිඳුනි හෙට ලොව දිනන්නට වෙහෙස
දරන ළමා අපිට
දෙමාපිය ආදරය
දේව දරු කම හා කිතුනු වගකීම් පවා
ඈතට ...... ඈතට ... ඈතටම..... නොපෙනී ගොසිනි

**නිර්මාණි දිසානායක**
09 ශ්‍රේණිය
ශාන්ත මරියා දහම් පාසල - වැල්ලවාය



## ගුරු මව්නි

ගුරු මවකි ඔබ මට විදු පියසේ සිටිනා
නැණ මල් පොඩි විකසිත කරනා
අප සැම ගුණ නුවණින් සරසනා
මව්නි ඔබේ ගුණ නිම නොවෙනා

**සෙව්මිණි ප්‍රබුද්ධි**
08 ශ්‍රේණිය
සා. මරියා දහම් පාසල - හාල්දඹුවන

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## ක්‍රිස්තියානි යාච්ඤාව

**නව ගිවිසුම තුළ යාච්ඤාව**

**18. ජේසුස් වහන්සේ නිතර නිතර දෙවි පියාට යාච්ඤා කළේ....**

★ දේව කැමැත්ත දැන ගැනීම සඳහාය.

**19. "ඔබ යාච්ඤා කරන කල ඔබේම ඇතුළු කාමරයට වැද දොර වසාගෙන ..... ඔබේ පියාණන්ට යාච්ඤා කරන්න" හිස්තැනට යෝග්‍ය වචනය වනුයේ** ★ රහසිගතව

**20. අපගේ ජීවිත ආලෝකවත් වීම සඳහා අත්‍යවශ්‍ය අංගයකි.**

★ නිරන්තරව යාච්ඤා කිරීම

**ස්වාමිවාක් ආරාධනාව**

**21. "මුළු මිනිස් සංහතියම එකම දරු කැලකි. මෙම සහෝදරත්වයේ බැඳීම පිළිගෙන ජීවත් වීමට ඇරයුම් කරන යාච්ඤාව වනුයේ....**

★ ස්වාමිවාක් ආරාධනාව

**22. ප්‍රශංසාව හා ඉල්ලීම අන්තර්ගතව ඇති යාච්ඤාව නම් ......**

★ ස්වාමිවාක් ආරාධනාව

**23. ස්වාමිවාක් ආරාධනාවේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණයක් නම් කර, එයින් ලැබෙන පණිවිඩ දෙකක් ලියන්න.**

★ සමිඳුන්ට ප්‍රශංසා කිරීම

- දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමට යොමු වීම
- ප්‍රශංසා කිරීමට ජනතාව යොමු කිරීම

**24. රටේ සාමය උදෙසා යාච්ඤාවක් වචන 50 කින් පමණ ලියන්න. එම යාච්ඤාව ස්වාමිවාක් ආරාධනාවේ දක්නට ලැබෙන සුලක්ෂණ පහ අනුව ගොඩ නැගිය යුතු වේ.**

★ දෙවි පියාණන් වහන්සේ, ඔබවහන්සේ අප වෙත ලබා දුන් මේ දේශය වෙනුවෙන් ස්තුති ප්‍රශංසා කරමු.

★ මේ සෞභාග්‍යමත් දේශයේ සියලු සැප සම්පත් සමඟින් ඔබ වහන්සේගේ උත්කෘෂ්ඨ නාමයට අපි නමස්කාර කරමු.

★ මේ දේශය වෙනුවෙන් ස්ථිරසාර සාමයක් උදාකර ගැනීමට වගකිව යුතු සියලු පාර්ශවයන් යොමු කරවන මෙන් ඉල්ලා සිටිමු.

★ සාමය වෙනුවෙන් අප විසින් කළ යුතු වගකීම් පැහැර හැරීම වෙනුවෙන් අපට සමාව දුන මැනව.

★ මේ භූමියෙහි සාමය වෙනුවෙන් කැප වෙන්නා වූ සියලු දෙනාගේ ජීවිත ඔබවහන්සේගේ සුරක්ෂිත භාවයට භාරකරමු.

★ සියලු ජීවිත විනාශයන්ගෙන් අප දේශය මුදවා , සාමයෙන් පිරි නිවහල් දේශයක් බවට එය නැවත පත් කළ මැනව. ආමෙන්.

**25. ස්වාමිවාක් ආරාධනාවේ සුවිශේෂි ලක්ෂණ දෙකක් ලියන්න.**

★ දෙවිඳුන්ට ප්‍රශංසා කිරීම ★ දේව නමස්කාරය

**26. ස්වර්ගයේ වැඩ සිටින යාච්ඤාව උච්චාරණය කරන විට දෑත් ඉහළට ඔසවන්නේ මන්ද?**

★ දෙවිඳුන්ට හිමි ගෞරවය හා ආදරය පුද කිරීමට

**උත්තම පූජක යාච්ඤාව**

**27. උත්තම පූජක යාච්ඤාව ක්‍රිස්තුන් වහන්සේ ......**

★ තමන් විසින්ම දෙවි පියාට කරන ලද යැදුමකි.

**28. ජුවාම් 17 පරිච්ඡේදයේ සඳහන් උත්තම පූජක යාච්ඤාවේ මූලික ලක්ෂණ තුනක් ලියන්න.**

★ මෙය ජේසුස් වහන්සේ විසින් කරන ලද යාච්ඤාවක් වේ.

★ ජේසුස් වහන්සේගේ මුළු ධර්මදූත ජීවිතයම කැටිකර පෙන්වයි.

★ යැදුමේ ආමන්ත්‍රණය දෙවි පියාණන්ට යොමු කරයි.

**29. උත්තම පූජක යාච්ඤාව.**

★ යාච්ඤාවේ පූර්ණත්වය විදහා පෑමකි.

**යාච්ඤාව සහ නව ගිවිසුමේ සුබාරංචි ආශ්‍රිත වෙනත් චරිත**

**30. දේව කැමැත්තට අවනත වූ මරියතුමිය ග්‍රාබියෙල් දේව දූතයාට දුන් පිළිතුර කුමක්ද?**

★ තමන් විසින්ම දෙවි පියාට කරන ලද යැදුමකි.

**31. ලුක් සුවිශේෂයේ සඳහන් ප්‍රශංසා ගීත (උදාන ගී) දෙකක් ලියන්න**

★ මරියාණන්ගේ උදාන ගීය ★ සෙකරියස්ගේ ප්‍රශංසා ගීය.

**යාච්ඤාව සහ මුල් කිතුනු සභාව**

**32. ඔවුහු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහිද, සහභාගිකමෙහිද, රොටි කැඩීමෙහිද,............ නිරතව කල් ගත කළහ. ඉහත හිස්තැනට නිවැරදි පිළිතුර වන්නේ.** ★ යාච්ඤාවෙහි ද

**33. බර්ණබස් සහ සාවුල් ධර්මදූත සේවාවට පිටත් කිරීමට පෙර අපෝස්තුළුවරුන් කුමක් කළේද, කරුණු දෙකක් ලියන්න.**

★ උපවාසයේ යෙදී සිටීම ★ ඔවුන් පිට අත් තැබීම

**ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

**ඉතිරිය ලබන සතියේ .....**

# ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය 28

## මැරෙන තුරු ජීවිත රහස හෙළි නොකළ ලෝක මහ ක්‍රිස්තියානි සංගීතඥයා

පසුගිය ලිපිය හා සබැඳේ

තම බේබදු පුරුෂයා ගේ ඇනුම් බැනුම් හා ගුටි බැට ආදියට දින පතා ගොදුරු වූ නමුත් ඔහුට දව උපන් පිරිමි දරු තිදෙනා උදෙසා ඈ පරිත්‍යාගයෙන් දුක් මුසු දිවියක් ගත කළාය. වැඩිමලා වූ බිතෝවන්ට වයස පහ වූ සමයේදීම ඔහුගේ හිත සංගීතයට ගිය බව මවට හා පියාට රහසක් නොවීය. බිතෝවන් ගේ මූලික අධ්‍යාපනය ගැන පවා පියා කිසි උනන්දුවක් දැක්වූයේ නැත. මවගේ කරදරය නිසා ලඟ තිබුණ පාසලට කුඩා බිතෝවන් අකමැත්තෙන් ගිය නමුත්, අකුරු ඉගෙනීමට ඔහු වැඩි කැමැත්තක් නොපෙන්වීය. ඔහු පියා වෙරි වී නිතර ම කියන සිංදුවක් පොඩි පුතා කට පාඩම් කරගෙන කැඩුන රෞකිඥ්ඤදයක් බදා ගෙන දවස ගෙවූයේ ය. ඔහු නින්දට ගියේ ද එය සමඟය. කුඩා බිතෝවන්ව පියා ප්‍රසිද්ධ මංසන්ධියකට කැඳවා ගෙන ගොස් ඔහු ලවා රෞකිඥ්ඤද ගස්වා, සින්දු කියවා මුදල් ලබාගෙන මත් පැන් බීවේ ය.



ලුඩ්විග් වැන් බිතෝවන්

පාසල් යාමට අකමැති වූ පුතු, සංගීතයට මහා ලෝලයක් පෙන් වූ බැවින් එම අංශයෙන් ඔහු උසස් කරවීමට බිතෝවන්ගේ මව වෙහෙස ගත්තීය. අසල විසූ මහලු ගාන්ධර්වයකු වෙත සංගීතය ඉගෙනීමට ඔහු යැවීය. එහෙත් කුඩා බිතෝවන් දමනය කිරීමට මහල්ලා අපොහොසත් වූයේ ය. ඔහු කියන දෙය ගෝලයා පිළිගත්තේ නැත. ගැයීමේ වැයීමේ ප්‍රස්තාර ගැන කියා දුන් විට, ඒවා හරි නැති බවත්, තමා සිතන ලෙසට ප්‍රස්තාර ලීවොත් වාදනය අපහසු වුවත්, වාදනයේ අලංකාරයත් සංගීතයේ ජීවමාන බවත් කැපී පෙනෙන බව කීවේය. මහලු ගාන්ධර්වයාගේ පරණ පියානෝව හා රෞකිඥ්ඤදය සැරෙන් සැරෙ බිතෝවන් තදින් ගැසූ බැවින් ඒවායේ නූල් කැඩී ගියෝ ය. මෙම අරුම පුදුම දමරික ගෝලයා ගුරුවරයාට එපා වූයේ සංගීත (ශාස්ත්‍ර ක්‍රමයට අනුව) ඔහුට ඉගැන් වීමට බැරි වූ බැවිනි. මේ වන තුරු කිසිවෙක් තුළ නොදුටු නොඇසූ සංගීත තලෙන්තු මෙම ළපටියා තුළ විද්‍යමාන බව ඒ පලපුරුදු ශාන්ත මහල්ලා ගේ මතය විය.

දෙළොස් වියේ බිතෝවන් සොළොස් වියේ ගැටවරයකුගේ පෙනුම ලැබුයේය. තම ස්ත්‍රිගේ තොරතෝන්චියක් නොමැති කරච්චලයෙන් බේරෙන්නට , අප සංගීත ශූරයාගේ බේබදු පියා, ඒ සමයෙහි ජර්මනියේ සිට ඕලන්දය දක්වා තැනින් තැන සංගීත වාදනයට යන ජර්මන් ජාතික ප්‍රසිද්ධ සංගීත කණ්ඩායමකට තම පුතුන් බාර දී මුදලක් ලබා ගත්තේය. එයින් බීවේය. මෙම සංගීත කණ්ඩායම සමග බිතෝවන්අවුරුදු දෙකක් ගත කරමින් ගායනයට හා වාදනයට සහභාගි විය. එහෙත් එයින් ඔහුට වැඩි ප්‍රයෝජනයක් වූයේ නැත. එයට හේතුව නම්, එම සංගීත කණ්ඩායමේ නායක ගාන්ධර්වයා ඉගැන්වූ ලෙස, කියා දුන් ලෙස බිතෝවන් නොගැයූ නො වැයූ බැවිණි. කිසිවකු යටතේ සංගීතය (ශාස්ත්‍ර ක්‍රමයට එකඟව) ඉගෙනීමට ඔහුට බැරි විය. කටකලියාවේ පට් කඩා ගෙන ජොකියාට අකීකරුවී, හිතුවක්කාර කමට වෙලාවෙත් අවේලාවෙත් ඉතා තදින් සැරෙන් වැරෙන් දුවන අස්වයකු ලෙස වූයේය. බිතෝවන් සෑහීමේ කෙළවර ඔහුට නැති විය. නොයෙක් අවස්ථාවලදි සංගීතාචාර්යයා ලියා තිබෙන ප්‍රස්තාර වැරදි බව ප්‍රසිද්ධියේ කීයේය. කරුණු කෙසේ වුවත් බිතෝවන් ගේ සංගීත දියුණුව දිනෙන් දින ජය බිම කරා ම ගමන් ගත්තේය.

මේ සමයෙහි ඕස්ත්‍රියාවේ වියානා නුවර ලෝක ප්‍රසිද්ධ මොසාට් නැමැති මහා සංගීතාචාර්යාය ගැන ඇසූ බිතෝවන් තම මව්ට පමණක් දන්වා පියාට හොරෙන් වියානා නුවරට ගියේය. එවක් හි ඔහු සොළොස් වියේ ගැටවරයෙකි. හැට පිරුණ මහා පළපුරුද්දක් ඇති ජනහිත දිනාගත් පුදුම සංගීත ශූරයෙක් වූ මොසාට්, බිතෝවන් දුටු පළමු දිනදීම. ලෝකයට මහා සංගීත තරුවක් පායා ඇති බව තමාට කියා ගත්තේය. ඔහු මුලු ජීවිත කාලයේදී නොදුටු නොඇසූ වාදන හා ගායන බල මෙම හැඩි දැඩි ජර්මන් ජාතික ගැටවරයා තුළ ගැබ් වී තිබෙන බව පිළිගත්තේය. ඉතා සතුටින් සංගීත ප්‍රස්තාර ලියන්නට ඉගැන්වූවේය. උසස් පද බැඳුමට තාල වැයුමට මග කියා දුන්නේය. මොසාට් ට ඇතිවූ එක ම දුක නම් තම ගෝලයා ගේ මූලික අධ්‍යාපනයේ පටු බව ය.

බිතෝවන් තම ජීවිතය ලෙස ප්‍රේම කළ සංගීතය ගැන, තමා තුළ බිහි වූ නවක අදහස් නිබයව එළිදරව් කිරීමට කැමති වූ එක ම ගුරුවරයා මොසාට් විය. දිගු පල පුරුද්දෙන් මොසාට් ලියූ ඉතා උසස් ගායනයේ සංගීත ප්‍රස්තාර සමහර විට ඉතා කල්පනාවෙන් හා අමාරුවෙන් ඔහු (මොසාට් පියානෝවෙන් ගැසූ නමුත් , ඒවා ඉතා පහසුවෙන් නිදහසින් හා නොකරදරයෙන් ගෝලයා ගැයුවේය. පසළොස්වක දක්වා දිනපතා වැඩෙන සඳ ලෙස බිතෝවන් අඩියෙන් අඩියට පඩියෙන් පඩියට සංගීත කලාවේ මුදුනට කිට්ටුවන විට, එම බලාපොරොත්තුවේ කරටිය කැඩුණි. කුමක් ද එය?

**සංස්කාරක පියතුමන් විසිනි**

ඉදිරියට .......

කිතුනු උරුමය

# රට රටවල කතෝ

| රට | කතෝලික පිරිස | මුළු ජනගහණය | ප්‍රතිශතය | රදගුරු පදවි | පදවි පු |
|---|---|---|---|---|---|
| ඊජිප්තුව | 299,000 | 82,999,000 | 0.36% | 12 | 205 |
| තායිලන්තය | 292,000 | 63,922,000 | 0.46% | 10 | 433 |
| බංග්ලාදේශය | 283,000 | 119,062,000 | 0.24% | 6 | 126 |
| ආර්මේනියාව | 270,000 | 3,018,000 | 8.94% | 2 | 6 |
| ඇල්බේනියාව | 235,000 | 2,460,000 | 9.55% | 4 | 22 |
| මාලි | 227,000 | 15,039,000 | 1.51% | 6 | 79 |
| සියෙරා ලියොන් | 186,000 | 5,966,000 | 3.12% | 3 | 69 |
| කසකස්තානය | 182,000 | 15,889,000 | 1.15% | 4 | 45 |
| ගිනියා | 171,000 | 6,646,000 | 2.57% | 3 | 80 |
| ලයිබීරියාව | 165,000 | 2,850,000 | 5.79% | 3 | 36 |
| සිංගප්පූරුව | 162,000 | 4,185,000 | 3.87% | 1 | 70 |
| ක්වේට් | 158,000 | 2,650,000 | 5.96% | 1 | 2 |
| එරිත්‍රියාව | 148,000 | 4,968,000 | 2.98% | 3 | 80 |
| ස්වීඩනය | 144,000 | 8,977,000 | 1.60% | 1 | 73 |
| ග්‍රීසිය | 123,000 | 11,862,000 | 1.04% | 11 | 53 |
| සාඕ තෝමේ හා ප්‍රින්සිපි | 121,000 | 138,000 | 87.68% | 1 | 2 |
| ගිනිබිසව් | 120,000 | 1,300,000 | 9.23% | 2 | 13 |
| සොලමන් දූපත් | 91,000 | 437,000 | 20.82% | 3 | 38 |
| බොට්ස්වානා | 83,000 | 1,735,000 | 4.78% | 2 | 16 |
| පලස්තීනය | 83,000 | 4,019,000 | 2.06% | 2 | 86 |
| ලිබියාව | 75,000 | 5,939,000 | 1.26% | 4 | 3 |
| බල්ගේරියාව | 74,000 | 8,000,000 | 0.93% | 3 | 17 |
| ඊශ්‍රායෙලය | 74,000 | 8,012,000 | 0.92% | 2 | 58 |
| සීෂෙල්ෂ් | 70,000 | 82,000 | 85.37% | 1 | 8 |
| නෝර්වේ | 55,000 | 4,556,000 | 1.21% | 3 | 27 |
| ස්වාසිලන්තය | 55,000 | 990,000 | 5.56% | 1 | 11 |
| ලාඕසය | 39,000 | 6,524,000 | 0.60% | 4 | 12 |

# ...ලික ජනගහණය

ශිරාන් මෛත්‍රී විසිනි

| ...ජක | නිකායික පූජක | මුළු පූජකවරු | ස්ථිර සේවාචාරීන් | පැවිදි (පිරිමි) | පැවිදි (කාන්තා) | මිසම් |
|---|---|---|---|---|---|---|
| | 327 | 532 | - | 462 | 1,323 | 205 |
| | 229 | 662 | - | 434 | 1,439 | 436 |
| | 131 | 257 | - | 226 | 1,059 | 81 |
| | 17 | 23 | - | 27 | 43 | 48 |
| | 26 | 48 | - | 35 | 177 | 72 |
| | 71 | 150 | - | 88 | 280 | 42 |
| | 51 | 120 | - | 80 | 39 | 61 |
| | 29 | 74 | - | 40 | 100 | 46 |
| | 19 | 99 | - | 36 | 100 | 56 |
| | 16 | 52 | - | 29 | 42 | 49 |
| | 67 | 137 | - | 132 | 202 | 30 |
| | 8 | 10 | 1 | 8 | 13 | 4 |
| | 252 | 332 | - | 347 | 562 | 110 |
| | 78 | 151 | 23 | 96 | 215 | 41 |
| | 37 | 90 | 3 | 65 | 124 | 86 |
| | 7 | 9 | - | 15 | 36 | 12 |
| | 54 | 67 | - | 78 | 133 | 30 |
| | 29 | 67 | - | 43 | 95 | 27 |
| | 40 | 56 | 1 | 44 | 72 | 33 |
| | 304 | 390 | - | 509 | 1,209 | 74 |
| | 20 | 23 | - | 20 | 133 | 13 |
| | 35 | 52 | - | 43 | 87 | 56 |
| | 30 | 88 | - | 38 | 612 | 18 |
| | 8 | 16 | 1 | 9 | 53 | 17 |
| | 43 | 70 | 3 | 48 | 173 | 32 |
| | 15 | 26 | - | 23 | 58 | 15 |
| | - | 12 | - | 2 | 83 | 77 |

ඉදිරියට .......



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 113

## TO..... FOR.... SO THAT

නිපාත පද ගැන අපි කලින් කතාකරල තියෙනවා. to, for, under, in, behind, over, on යනාදි වචන නිපාත පද බව අපි දන්නවා. වාක්‍යයක ඇති නාම පද දෙකක් අතර ඇත්තේ මොන වගේ සම්බන්ධයක් ද කියන එක තමයි ඇත්තෙන්ම නිපාත පදයකින් (preposition) කියැවෙන්නේ.

මේ නිපාත පද අතරෙනුත් විශේෂයෙන් to, for, යනාදි වචන අපිට නිතර නෙත ගැටෙනවා. ඒ වගේම සමහර විට ඉතා කිට්ටු අදහසක් මින් කියැවෙන නිසා වඩා නිවැරදි කෝකද කියල හරියටම හිතාගන්නත් අපිට බැරිවන අවස්ථා තියෙනවා. ඒ නිසා අපි preposition ගැන අද නැවත හැරී බැලීමක් කරමු.

යමෙක් යමක් කිරීමට හේතුව ප්‍රකාශ කිරීමට අපි to යොදනවා. ඇයි එහෙම කරන්නෙ, මොකක් අරමුණු කරගෙන ද කරන්නෙ කියා අදහස to යෙදීමෙන් ප්‍රකාශ කරන්න පුළුවන්.

**නිදසුන්:** Why are you going out? (වයි ආ(ර්) යූ ගොයිං අවුට්?)
I am going out **to post** a letter. (අයැම් ගොයිං අවුට් ටු පෝස්ට් අ ලෙට(ර්)) මම යන්නෙ ලිපියක් තැපැල් කිරීමට

Rasika phoned **to invite** me to a party. රසිකා ෆෝන්ඩ් ටු ඉන්වයිට් මී ටු අ පා(ර්)ටි. රසිකා පාටියකට ආරාධනා කිරීමට මට කතාකළා.

I **shouted to warn** the driver about the train at the level-crossing. (අයි ෂවුටඩ් ටු වෝ(ර්)න් ද ඩ්‍රයිවර් අබවුට් ද ට්‍රේන් ඇට් ද ලෙවල් ක්‍රොසිං) මම රියදුරාට අනතුරු ඇඟවීමට කෑගැහුව්වා, දුම්රිය හරස් පාර ළඟදී

{අමතර සටහන
දුම්රිය පාරක් වාහන යන පාරකට හරස් වන තැනකට කියන්නෙ Level - Crossing (ලෙවල් ක්‍රොසිං) සමහරු කියන්නෙ රේල් ගේට්. ඒක වැරදියි. රේල් පාරක් හරස් වන තැනකදී ලෙවල් ක්‍රොසිං යන වචනය යෙදීමට පුරුදු වෙන්න.

My mother went to the school **to pay** the school fees.
(මයි මද(ර්) වෙන්ට් ටු ද ස්කූල් ටු පේ ද ස්කූල් ෆීස්)
මගේ මව පාසලට ගියා පාසල් ගාස්තු ගෙවීමට

Sheela went to the library **to return** the books she had borrowed.
(ශීලා වෙන්ට් ටු ද ලයිබ්‍රරි ටු රිටර්න් ද බුක්ස් ෂී හැඩ් බිරෝඩ්)
ශීලා පුස්තකාලයට ගියා ඇය ගත්තු පොත් නැවත භාර දීමට

I asked him **to wait** till I finish my work
(අයි ආස්ක්ඩ් හිම් ටු වේට් ටිල් අයි ෆිනිෂ් මයි වර්ක්)
මගේ වැඩ ඉවරවන තුරු මම ඔහුට ඉන්න කීවා.

බලන්න ඉහත හැම වැකියකම "to" යොදල තියෙන්නෙ යම් ක්‍රියාවක "අරමුණ", "කුමක් සඳහාද" කියන අදහස ප්‍රකාශ කිරීමට බව ඔබට පැහැදිලි ඇති.

**යමෙක් යමක් කරන්නෙ කුමන අරමුණක් සඳහා ද කියන කරුණ සඳහා to යොදනව වගේම යම් දෙයක් තිබෙන්නෙ මොන අරමුණක් නිසා ද කියන කරුණ පිළිබඳවත් to යොදන බව අපි අවබෝධ කරකගත යුතුයි.**

මේ නිදසුන් බලන්න;
This wall is **to keep** people out of the garden.
(දිස් වෝල් ඉස් ටු කීප් පීපල් අවුට් ඔෆ් ද ගාර්ඩ්න්)
මේ තාප්පෙ තියෙන්නෙ මිනිසුන්ව වත්තෙන් පිටත තබන්නයි.

There is a team of security guards **to protect** the building.
(දෙයා(ර්) ඉස් අ ටීම් ඔෆ් සෙකියුරිටි ගාඩ්ස් ටු ප්‍රොටෙක්ට් ද බිල්ඩිං)
ආරක්ෂක නිලධාරීන් පිරිසක් ඉන්නෙ මේ බිල්ඩිම ආරක්ෂා කිරීමට

Pens are there **to write.** (පෙන්ස් ආ(ර්) දෙයා(ර්) ටු රයිට්)
පෑන් තියෙන්නෙ ලියන්න. Don't worry, I'm there **to help** you.
(ඩෝන්ට් වොරි, අයැම් දෙයාර් ටු හෙල්ප් යූ)
කරදර වෙන්න එපා. ඔබට උදව් කිරීමට මම ඉන්නවා)

There are many buses to **Anuradhapura** during the festive season.
(දෙයා(ර්) ආ මෙනි බසස් ටු අනුරාධපුර ඩියුරිං ද ෆෙස්ටිවල් සීසන්) උත්සව කාලෙට අනුරාධපුරයට ගොඩක් බස් තියෙනවා.

බලන්න මේ ඉහත වැකි වලින් කියැවෙන්නේ යමක් තිබෙන්නෙ මොන අරමුණකට ද යන බව අඟවන්නයි.

ඒ ඉහත සඳහන් ක්‍රම දෙකම එකට එකතු වී වාක්‍යයක අදහස් ප්‍රකාශ වෙන වෙලාවලුත් තියෙනවා.

ඒ කියන්නෙ යමෙක් යමක් කරන්නෙ යම් දෙයක් සඳහායි කියන අතරම යම් දෙයක් තිබෙන්නෙ මොන අවස්ථාවක් නිසා ද කියන කරුණු දෙකම මුලු කර අදහස් කිරීමට අපිට 'to' යොදාගන්න පුළුවන්.

It is difficult to find a place to park (ඉට් ඉස් ඩිෆිකල්ට් ටු ෆයින්ඩ් අ ප්ලේස් ටු පාර්ක්) වාහනය පාක් කරන්න තැනක් හොයාගන්න හරිම අමාරු වුණා.

Would you like something to eat? (වුඩ් යූ ලයික් සම්තින්ග් ටු ඊට්?)
මුකුත් කන්න ඔබ කැමතිද?

I have to find time to do my home work.
(අයි හැව් ටු ෆයින්ඩ් ටයිම් ටු ඩූ මයි හෝම්වර්ක්)
මට මගේ විභාගෙ වැඩ සඳහා කාලය සොයාගැනීමට අවශ්‍යයි.

# ළමා ප්‍රදීපය කැමරා කාචයේ සටහන් වූ ලෝක ළමා දින සැමරුම්



''ලෝක ළමා දිනය'' නිමිත්තෙන් රාගම, පේරලන්ද ළදරු ජේසු පෙර පාසලේ පාලිකා නදීෂා ගුණතිලක මහත්මියගේ ආරාධනයෙන් කඳාන ද මැසිනොද් විදුහලේ ආචාර්ය මණ්ඩලයේ පසිඳු ගීත් නිමන්ත සහ සම්පත් කෞමින්ද යන මහත්වරුන් විසින් සිඟිත්තන් සඳහා චිත්‍ර කලා වැඩ මුළුවක් පෙර පාසල් පරිශ්‍රයේදී පැවැත්විණි.

එම වැඩමුළුව අවසානයේදී එම මහත්වරුන් හා ආචාර්ය මණ්ඩලය සමඟ සහභාගිවූ සිඟිත්තන් ''ළමා ප්‍රදීපය '' සඳහා සේයාරුවකට මුහුණ දුන් අයුරු. **සී.ආර්.ඩික්සන් ඇන්ටනි**

ලෝක ළමා දිනය සැමරුම් උත්සවයක් හලාවත සෙඩෙක් ආයතනයේ දී හලාවත පදවි සෙඩෙක් අධ්‍යක්ෂ ගරු රොන්කල්ලි ද සිල්වා පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක ළමා සමිති වල ළමෝ දෙමාපියන් හා ගුරුවරුන් මේ සඳහා සහභාගී වූහ.

කොළඹ කරිටාස් සෙඩෙක් ජාතික ආයතනයේ ව්‍යාපෘති භාර ගරු නිලන්ති රණසිංහ පැවිදි සොහොයුරිය මීට සහභාගිවිය. මෙහිදී ළමුන්ගේ කුසලතාවයන් ඉදිරිපත් කළ අතර ළමුන් මුහුණදෙන ගැටලු ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසුණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ. **රංජිත් විජේසිංහ**



# ගොඩැල්ල මීසමේ සුදතුම් වරම් ලබන යොවුන් දූ පුතුන්ට නූතන මාධ්‍ය භාවිතය පිළිබඳ විශේෂිත වැඩසටහනක්

ගොඩැල්ල මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමාගේ මෙහෙයවීමෙන් මීසම තුළ වූ ගොඩැල්ල, තඹරවිල, මෝරුක්කුලිය, දංකොටුව දහම් පාසල්වල අභිවෘද්ධිආලේපය ලැබීමට සූදානම් වන දරුවන් සඳහා විශේෂිත දෙසුමක් ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසින් ගොඩැල්ල සා. සෙබස්තියන් මුනි දෙව් මැදුරේදී පවත්වන ලදී.

''නූතන මාධ්‍ය භාවිතය හා තාරුණ්‍යය'' යන තේමාව යටතේ මෙම දැනුම්වත් කිරීම සිදුවිය. මාධ්‍යය (විද්‍යුත්/මුද්‍රිත) අන්තර් ජාලය, මුහුණු පොත්, ජංගම දුරකථන හා විලාසිතා නිසා වන බලපෑම පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාදෙන ලදී.

අද මාධ්‍ය නිසා සමාජයේ දරුවන් නොමගට යන අන්දමත්, යොවුන් ජීවිතවල වටිනාකම් ගැන හා අයහපතින් යහපත්දේ වෙන්කර ගන්නා අන්දම පිළිබඳ ළමුන් දැනුම්වත් කළ අතර ගීත භාවනාවක්ද විය. දේශක මහතා පැවැත්වූ 96 වැනි වැඩසටහනද මෙය විය. වැඩමුළුව සංවිධානයේදී මීසම් සහයක ධනුෂ්ක ප්‍රනාන්දු පියතුමා ප්‍රබල දායකත්වයක් ලබාදුනි.

✍ **එච්.ඒ. සිරිල් පෙරේරා**



**දෙසුම පැවැත් වූ කුමර නයනජිත් මහතා හා මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමා**



**වැඩසටහනට සහභාගි වූ ළමුන්ගෙන් කොටසක්**

### නත්තල් සඟරාවට ළමා නිර්මාණ යොමු කිරීමට ඇරයුමක්

මහනුවර පදවි ජන සංනිවේදන කේන්ද්‍රය මගින් ප්‍රකාශයට පත් කෙරෙන ''පවස'' නත්තල් සඟරාව සඳහා නත්තල හා බැඳුණු ළමා නිර්මාණ , (චිත්‍ර, කවි, රචනා) නොවැම්බර් 15 වනදට පෙර ''පවස'' ගරු අධ්‍යක්ෂක පියතුමා අංක 141, ඩී.එස්. සේනානායක වීදිය, මහනුවර යන ලිපිනයට යොමු කරන්න. **රෝහිණි ඇන්තනි**



**වික්ෂෝප දේව මෑණියෝ**

**රවිඳු නිම්ෂාන් ෆොන්සේකා**

03 ශ්‍රේණිය
ශා. ජෝශප් විදුහල - මීගමුව ශාඛාව



**දෙව්ඳු ප්‍රේමය**

**හේෂලී පෙරේරා**

06 ශ්‍රේණිය
ශා. පිලිප්නේරි දහම් පාසල
උදම්මිට - (දෙහියාගාත මීසම)




**ධීවර ජීවිතය**

**අමිල නවෝද්‍යා පොන්සේකා**

06 ශ්‍රේණිය
සදසරණ දේව මාතා දහම් පාසල
බලගල



**නෙළුම් මල් නෙළන ළමුන්**

**බෙත්මි මිතාරා රණතුංග**

06 ශ්‍රේණිය
කිතු දහම් පාසල
පල්ලන්සේන



**මල් මෝස්තරයක්**

**සිත්මල් උදන සිල්වා**

03 ශ්‍රේණිය
ලොයොලා විදුහල
බෝපිටිය



**මැවිල්ලේ අධිපතියාණෝ**

**පෝෂක බෝගහලන්ද**

07 ශ්‍රේණිය
සාන්ත ජෝසප් විදුහල
කොළඹ 10



# ශු. 1 වන එව්ජින් පාප්තුමා



සුදුවර චරිත

ශු. සභාවේ 75 වන ශුද්ධෝත්තම පියතුමා ලෙස මෙතුමා පදවි ප්‍රාප්ත වුයේ ක්‍රි.ව. 654 අගෝස්තු 10 වන දින දිය. එතුමාගේ දිවිය තුළ සැම විටම දැහැමි බව හා දක්ෂ කතිකත්වය නිසා සැමවිටම කාර්යශූර ලෙස ක්‍රියා කරන ලද පුජාප්‍රසාදි තුමකු ලෙස සැලකේ. රවෙන්නාහි එසාර්ක් වරයා විසින් එතුමාට සුදතුම් පිය නිලවරණයට පෙනී සිටින ලෙස බලකරන ලද බව සභා ඉතිහාසයේ කියැවේ.



තවද කොන්ස්තන්තීනුපලයේ අගරදගුරු ලෙස අධිරාජයා විසින් පීටර් නැමැත්තකු තෝරා ගත් බවත් ඔහු විසින් ශුද්ධෝත්තම පියතුමා වෙත ලිපියක් යවමින් ඔහු මොනෆිසිට් වාදියකු බව දන්වා සිටි අතර පාප්තුමා ද ඔහුව එම ධුරයෙන් පහකරන ලදි. ක්‍රි.ව.655 දී ෆීනික්ස් හිදී පැවති සටනින් මුස්ලිම්වරුන් විසින් අධිරාජයා පරාජයට පත් නොකරන්නට මාර්ටින් පාප්තුමන්ට අත්විඳින්නට සිදු වූ ඉරණම මෙතුමන්ටද අයත් වන්නට ඉඩ තිබිණි. මෙතුමා ඉන් මිදෙන ලදී. මෙතුමා සිය පාලන සමයෙන් අවු. 3ට වඩා වැඩිකලක් විප්‍රවාසීව හා සිරගතව් කල් ගත කළේය.

පාප්ධුරයට පත්වීමෙන් ස්වල්ප දිනකට පසුව ලැටරන්හිදි මෙතුමා රදගුරු වරුන්ගේ සමුළුවක් කැඳවීය. රදගුරුවරු 150 ක් පමණ පැමිණ සිටි අතර, එහි සැසි වාරයන් 5 ක් පැවති අතර මොනෆිසිට්වාදය හා එහි නායකයන් සියලු දෙනා ප්‍රතික්ෂේප කළ අතර ඇලෙක්සැන්ඩ්‍රියාවේ හා කොන්ස්තන්තිනෝපලයේ රදගුරු වරුන් වෙත නෙරපා දැමීමේ ආඥාවද පනවන ලද්දේ මෙතුමා විසිනි. මෙම සමුළුවේදී ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳවත් උන්වහන්සේගේ ස්වභාවයත්, ධර්මතා හා අභිමානයත් පිළිබඳව කතෝලික ඉගැන්වීම සඳහන් පැහැදිලි නිර්වචනයන් ද සකස් කරනු ලැබිය.

මෙය පෙරදිග රදගුරුවරුන් සියලු දෙනා වෙත යවනු ලැබීය. මෙතුමාගේ පාලන සමය පුරාවට අභිනව රදගුරුවරුන් 21 දෙනෙකු අභිෂේක කොට යුරෝපය පුරා යැවු අතර මෙතුමාගේ පාලන සමය ඉතා සාමකාමී ස්වර්ණමය කාලපරිච්ඡේදයක් ලෙස සලකනු ලැබේ. ක්‍රි.ව. 657 ජුනි 02 දින මෙම සාන්තුවර පාප්තුමා ස්වර්ගස්ත විය.

**අසේල දසනායක විසිනි**

## බෝපිටිය ලොයලා විදුහලේ මාධ්‍ය ඒකකයේ දක්ෂ ලේඛකයෝ

**වැඩමුළුවක ප්‍රතිඵලයක්**

### අම්මා



හොඳ නරක කියාදී
මඟ පෙන්වන අම්මේ
අයනු ආයනු කියා කීමට
වෙර දෙන අම්මේ
වරදට දඬුවම් කළත්
නෑ තරහක් අම්මේ
ඔබට කවි ලියුමට හෝඩියේ
අකුරු මදි අම්මේ

**නෙත්මි රේෂානා**
09 ශ්‍රේණිය
ලොයලා විදුහල බෝපිටිය

### කුරුළු පැටව්

කුරුළු කූඩුවේ අපි
සතුටින් ඉන්නේ
එහා මෙහා පියාඹමින්
විනෝද වී අපි සැවොම
හැමදාමත් සමගියෙන්
ඉන්නේ

**ලුෂාල් ශාක්‍ය**
05 ශ්‍රේණිය
ලොයලා විදුහල - බෝපිටිය



**පවල් අරවින්ද**
07 ශ්‍රේණිය
ලොයලා විදුහල බෝපිටිය

### දයාබර ගුරු මව්නි

හමුවුණි ඔබව මා හට
මගේ ජීවිතයේ
උපදෙස් දුනි දිනුමට
ජයටැඹ දැනුමේ
ඔවදන් දුනි, වීමට උණ
ගසක් ලෙසේ
අහස සිඹින විට නැමුමට
පොළොව වෙතේ

**ආශා චාමරී රොවෙල්**
10 ශ්‍රේණිය
ලොයලා විදුහල බෝපිටිය

## ප්‍රහේලිකා අංක 41




### හරහට

1. අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කළ යුතු බව පෙන්වීමට ......... හා විනිශ්චකාරයා පිළිබඳ උපමාව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක, මෙහි හිස්තැනට සුදුසු වචනය.

4. ශුද්ධවූ සභාවේ පනත් සංඛ්‍යාව

6. දෙවිපියාණන් අපට දී ඇති හැකියාවන් වර්ධනය කර දේව රාජ්‍යය වෙනුවෙන් යෙදවිය යුතු බව පෙන්වීමට ..... දසය පිළිබඳ උපමාව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක . මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. තම ....සතුටු කරන තැනැත්තේ සමිඳුන්ට කීකරු වන්නේය. යනුවෙන් උපදෙශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

11. අග්‍රදූතයන්ගෙන් එක් කෙනෙකි.

### පහළට

1. සදොම් සහ ගොමෝරා නුවරවල් .... වලක්වාලීමට ආබ්‍රහම් තුමා දෙවිපියාණන් ඉදිරියේ මැදිහත් විය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

2. ක්‍රිස්තුන් වහන්සේ සිදුකළ විවිධ ප්‍රාතිහාර්යයන් නිසා උන්වහන්සේ පිළිබඳ පුවත...... පැතිරී ගියේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ගිනිගත් නොදැවෙන පඳුර මැදින් දෙවිඳුන් මෝසෙස්ට කථා කරමින් ''ඔබේ පාද වලින් ..... ගලවා දමන්න''. ඔබ සිටින ස්ථානය ශුද්ධ භූමියෙකැ'යි වදළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

5. ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ග රාජ්‍යයේ ..... ශු. පේදුරු තුමාට පැවරූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

7. බදු පොළේ සිටි මෙම අයකැමියාට ක්‍රිස්තුන් වහන්සේ ''මා අනුව එන්න ''යයි වදළ සේක.

9. කානා නුවර විවාහ මංගල්‍ය අවස්ථාවේදී ක්‍රිස්තුන් වහන්සේ මේවා මිදි යුෂ බවට හැරවූ සේක.

10 මේවා ගසා මරා දැමීම සඳහා පව්කාර ස්ත්‍රිය මිනිසුන් විසින් ක්‍රිස්තුන් වහන්සේ වෙතට ගෙන ආවේය.

**(මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ලූක් 5/27,18, 9/11 ශු. මාක් 1/40 , ශු. ජුවාම් 8, උපදේශකයා හෙවත් සිරාක් 3/6, උත්පත්ති18/16, නික්මයාම 3/5**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර**

## ඒත්තුකාල දහම් ළමුන්ගෙන් අත්කම් ප්‍රදර්ශනයක්

වැල්ලවීදිය මීසමට අයත් ඒත්තුකාල ශා. සිල්වෙස්ටර් දහම් පාසලේ ළමුන්ගේ අත්කම් ප්‍රදර්ශනයක් පසුගියදා ඒත්තුකාල දෙව්මැදුරු භූමියේදී පැවැත්වුණි. මෙය කොළඹ උතුරු කලාපීය නාහිමි අතිගරු ප්‍රැටික් පෙරේරා පියතුමන් අතින් විවෘත කෙරිනි.

මීසම් සේවක ගරු ටෙරන්ස් බෝදියාබඳුගේ සහයක ගරු ක්ලේරියන් පියතුමන්ලාගේ මග පෙන්වීම යටතේ දහම් ගුරු භවතුන්ගේ හා දෙමාපියන්ගේ සහයෝගයෙන් සංවිධානය කෙරිනි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ

**සිල්වෙස්ටර් ප්‍රනාන්දු**



## ශා. අන්තෝනි විද්‍යාලයීය පා ගමන

2014 වර්ෂයට යෙදෙන කොල්ලුපිටිය ශාන්ත අන්තෝනි බාලිකා මහා විද්‍යාලයේ 75 වෙනි දියමන්ති ජයන්තිය නිමිත්තෙන් පාසලේ ඉදිරි සංවර්ධනය අරමුණු කොටගත් පා ගමනක් පැවැත්වුණි. විදුහල්පතිනි ගරු සොනාලි පැවිදි සොයුරියගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ සංවිධානය කෙරිනි. කොළඹ කතෝලික පෞද්ගලික පාසල් අධ්‍යක්ෂ ගරු රංජිත් මදුරාවල, බම්බලපිටිය ශාන්ත පීතර විද්‍යාලයේ විදුහල්පති ගරු ට්‍රෙවිස් ගේබ්‍රියෙල් යන පියතුමන්ලා ළමුන් හා දෙමාපියන් ඇතුලු බොහෝ පිරිසක් මීට එක් වූහ.

## "ළමා ප්‍රදීපය" 5 වන සංවත්සරයට ඔබත් එක්වන්න.

ආදර දුවේ පුතේ, ''ළමා ප්‍රදීපය'' ළමා ඔබේ පුවත් පතේ 5 වන සංවත්සර කලාපය සඳහා ඔබේ සුභ පැතුම්, නිර්මාණ ඔක්තෝබර් 25 වන දිනට පෙර, ''ළමා ප්‍රදීපය'', 5 වන සංවත්සර කලාපය අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.

සංස්කාරක පියතුමා


ශුද්ධවූ බයිබලය ඇසුරෙන්
චිත්‍රකථා රචනය
- ආනන්ද කල්දේරා -
මෝසෙස් 21
දෙබස් හා චිත්‍ර
ඇස්. ඒ. පී. සපුආරච්චි
ඔයාව අපේ ගෙදරට එක්ක එන්න කියලා අපේ තාත්තා කිව්වා..
ජෙත්‍රෝගේ නිවසට පැමිණි මෝසෙස්ට...... රාත්‍රී භෝජනය සකසා දුන් ඔවුන්...
ඔබ කොහේ සිටද මිදියන් වෙත ආවේ
මම මෙහි ආවේ ඊජිප්තුවේ සිටයි.
ඊට පසු ඔහු ඊජිප්තුවෙන් පලා.. ඒකට හේතුවත් අනෙකුත් සියලු විස්තරත් ජෙත්‍රෝට පැවසුවා..
මෝසෙස් ඔබ කැමතිනම්, අපිත් එක්ක ඉන්න පුළුවන්. මෙහි නැවතී අපේ වැඩ කටයුතුත් බලාගෙන බැටළුවන් බලාගෙන මෙහිම ඉන්න පුළුවන්..
හොඳයි.. මම කැමතියි.. මා මෙහි නවතින්නම්..
මේ මගේ වැඩිමල් දියණිය සිප්පෝරා..
ඉන් පසු මෝසෙස් ජෙත්‍රෝගේ නිවසේ නතර විය.. ඔහු බැටළුවන් බලාගනිමින් ජීවිකාව ගත කරන්නී..
මෝසෙස්ට තම ඊශ්‍රායල් ජාතිකයින් ඊජිප්තුවේ දුක් විඳින හැටි නිතරම මතක් වෙන්නට විය..
මගේ ජාතිය.. ඊජිප්තුවේ දුක් විඳිනවා.. මම කොහොමද ඒ අයව එයින් ගලවාගන්නේ..



ළමා ප්‍රදීපය

# දරුවන්ට අධ්‍යාපන අත්වැලක් වූ නුවර එළිය හෝටල් පාසල නාසරෙත් නිවාඩු නිකේතනය





අධ්‍යක්ෂ
නොයෙල් පෙරේරා
සහෝදරතුමා



කලමණාකාර
පෝල් ජෝශප් මහතා

රාගම දියගල ළමා නගරයට (Boys Town) අනුබද්ධිත නුවර එළිය ළමා ගම්මානය අද වන විට වැඩි දුර අධ්‍යාපනය නොලැබූ දරුවන් සඳහා හෝටල් පරිපාලනය හා කලමනාකරණය උගන්වන 'හෝටල් පුහුණු පාසලක්' දක්වා වර්ධනය කර තිබෙනවා. කලින් සත්ව ගොවිපලක් හා භෝග ගොවිපලක් තිබුනද අද එය හෝටල් පාසල සමඟ භෝග හා පළතුරු ගොවිපලක් පවත්වාගෙන යනවා. 1910 දී ඉදි වූ ඉතා කුඩා අලංකාර දෙව් මැදුරක්ද මෙහි තියෙනවා. ද ලාසාල් නිකායේ සහෝදරතුමන්ලා විසින් පාලනය කරනු ලබන මෙම හෝටල් පාසල ප්‍රමුඛ නිවාඩු නිකේතනයේ වත්මන් පරිපාලක වනුයේ ගරු නොයෙල් පෙරේරා සහෝදරතුමා වන අතර එහි කළමනාකරු ලෙස පෝල් ජෝශප් ඇල්බට් මහතා කටයුතු කරනු ලබනවා. පුංචි ඔබට පවුලේ අය සමඟ නුවරඑළියේ නිවාඩුව ගත කිරීමට යෑමේදී ඉතා අඩු මිලට නවාතැන් පහසුකම් ලබා ගත හැකි තැනක් මෙන්ම. අධ්‍යාපනය අතරමග නැවතුනු දරුවන්ට වැඩි දුරටත් නොමිලේ හෝටල් පරිපාලනය හැදෑරීමටත් හැකි කතෝලික සභාවට අයත් තවත් ආයතනයක් තමයි 'නාසරෙත් නිවාඩු නිකේතනය' කියන්නේ.

**සටහන/ ඡායාරූපඃ තිළිණ අලහකෝන්**









